# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023 ජනවාරි 31 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2022 දෙසැම්බර්

## සුවිශේෂී කරුණු

- මෙතෙක් වාර්තා වූ ඉහළම අපනයන ආදායම වාර්තා කරමින් 2022 වසරේ දී අපනයන ආදායම ස්ථාවර අගයක පැවති අතර, ආනයන වියදම 2021 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය.
- 2010 වසරේ සිට වාර්තා වූ අඩුම වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ දී වාර්තා විය.
- 2021 වසරේ දී වූ ශුද්ධ ගෙවීමට සාපේක්ෂව, 2022 වසරේ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත විදේශ ආයෝජනයන්හි කැපී පෙනෙන ශුද්ධ ගලා ඒමක් වාර්තා කළේය.
- 2021 වසරට සාපේක්ෂව, 2022 වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මධ්‍යස්ථ වුව ද, සංචාරක ඉපැයීම් යථා තත්ත්වයට පත් වූ අතර සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

### වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩො. බිලියන)







| වෙළඳ හිඟය | දෙසැ. | ජන.-දෙසැ. |
|---|---|---|
| 2021 | 1.1 | 8.1 |
| 2022 | 0.4 | 5.2 |




### සංචාරක ඉපැයීම්




### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (එ.ජ.ඩො. මිලියන)




### දළ නිල සංචිත*




* චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.

### කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම්

(ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ - ශුද්ධ)
(එ.ජ.ඩො. මිලියන )




### රජය වෙත දළ ලැබීම් (එ.ජ.ඩො. මිලියන)




* දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2022 නොවැම්බර් මාසය දක්වා පමණි.

### විනිමය අනුපාතිකයේ වෙනස්වීම් (එ.ජ. ඩොලරයට රුපියල්)



## 2022 වසරේ වෙළඳ භාණ්ඩ ගිණුමේ ක්‍රියාකාරිත්වය

2022 වසරේ අපනයන ආදායම, 2021 වසරේ වාර්තා වූ ඉහළම අගයට වඩා සියයට 4.9ක ඉහළ යෑමක් වාර්තා කරමින්, ප්‍රථම වරට එ.ජ. ඩොලර් බිලියන 13 ඉක්මවා ගියේය. මෙම වර්ධනය සඳහා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ඇතුළු කාර්මික අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. මේ අතර, 2022 වසරේ සමස්ත ආනයන වියදම, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 11.4ක පහළ යෑමක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 18,291ක් වූ අතර, මේ සඳහා හදිසි නොවන ආනයන සීමා කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ 2022 වසරේ වැඩි කාලයක් වෙළඳපොළ තුළ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා ගැටළු හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසරේ වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,139 සිට, 2010 වසරේ සිට වාර්තා වූ අවම අගය ලෙස, එ.ජ. ඩොලර් මිලියන 5,185 දක්වා පහළ ගියේය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟයෙහි පහළ යෑම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**රූප සටහන 1: 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ වෙළඳ හිඟය වෙනස් වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම**
(එ.ජ. ඩොලර් මිලියන)




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ ශේෂය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය

වෙළඳ ගිණුමේ හිඟය, අපනයන පහළ යෑම හා සැසඳීමේ දී ආනයන විශාල වශයෙන් පහළ යෑමත් සමඟ 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,085 සිට 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 358ක් දක්වා පහළ ගියේය.

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,068ක් දක්වා සියයට 7.7කින් පහළ ගියේය.** 2022 වසරේ දෙසැම්බර් මාසයේ අපනයන ආදායම පහළ යෑම සඳහා කාර්මික අපනයනවලින් ලද ආදායමෙහි පහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

**කාර්මික අපනයන:** 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී කාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව පහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් බොහෝ ප්‍රධාන වෙළඳපොළ (ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය) තුළ පැවති ඉහළ උද්ධමනය හා සම්බන්ධ වියදම් ධාරිතාව පහළ යෑම සහ ආර්ථික අවපාතමය තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ඇඟලුම් අපනයන පහළ යෑම හේතු විය. එමෙන්ම, ටයර් සහ ගෘහස්ථ රබර් අත්වැසුම් අපනයන පහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිතවලින් ලද අපනයන ආදායම අඛණ්ඩව පහළ ගියේය. තවද, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, ඉලෙක්ට්‍රොනික උපකරණ) අපනයන ආදායම ඉහළ ගිය ද, ආහාර, පාන වර්ග හා දුම්කොළ (ප්‍රධාන වශයෙන්, සකස් කළ දුම්කොළ) අපනයනවල සැලකිය යුතු පහළ යෑමක් වාර්තා විය.

**කෘෂිකාර්මික අපනයන:** තේ අපනයන මිල ගණන්වල සාමාන්‍යය ඉහළ ගිය නමුත් පොහොර ප්‍රමාණවත් මට්ටමින් නොපැවතීමේ පසු බලපෑමෙහි ප්‍රතිඵලයක් ලෙස තේ අපනයන පරිමාව පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම සුළු වශයෙන් පහළ ගියේය. කුළුබඩු යටතේ වර්ගීකරණය කරන ලද ගම්මිරිස් අපනයන පරිමාව පහළ යෑම හේතුවෙන් අනෙකුත් කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පහළ ගියේය.

**ඛනිජමය අපනයන:** ප්‍රධාන වශයෙන් ටයිටේනියම් ලෝපස් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ඛනිජමය අපනයන ආදායම, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව ඉහළ ගියේය.

**රූප සටහන 3: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: අපනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

[1] අපනයන සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් අපනයන සංයුතිය, පිළිවෙළින්, ඇමුණුම II සහ ඇමුණුම IIIහි දක්වා ඇත.

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2022 වසරේ මාර්තු මාසයේ සිට දක්නට ලැබුණු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යමින්, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,241ට සාපේක්ෂව 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,426ක් දක්වා සියයට 36.4කින් පහළ ගියේය.** 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති ඉහළ ආනයන වියදමෙහි පදනම් බලපෑම සහ සියලුම ප්‍රධාන ආනයන අංශවල පරිමාවන් පහළ යෑම මේ සඳහා හේතු විය.

**පාරිභෝගික භාණ්ඩ:** 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ප්‍රධාන වශයෙන්, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (2021 වසරේ දෙසැම්බර් මාසයේ දී කොවිඩ් එන්නත් සඳහා සිදු කළ විශාල වියදම්හි පදනම් බලපෑම මත) ආනයන පහළ යෑම මගින් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව පහළ ගියේය. මීට අමතරව, හදිසි නොවන ආනයන සීමා කිරීමට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් ද අනෙකුත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සියල්ලම පාහේ පහළ ගියේය. ආහාර සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම ද, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව පහළ ගිය අතර, ඒ සඳහා ධාන්‍ය වර්ග සහ ඇඹරුම් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදිත ආනයන (ප්‍රධාන වශයෙන්, සහල්) පහළ යෑම හේතු විය.

**අන්තර් භාණ්ඩ:** 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මූල ලෝහ (මූලික වශයෙන්, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී යකඩ හා වානේ ආනයන ඉහළ යෑමේ පදනම් බලපෑම) සහ රෙදිපිළි සහ රෙදිපිළි උපාංග (මූලික වශයෙන්, රෙදි වර්ග) ආනයන පහළ යෑම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව පහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ආනයන පරිමාවන් පහළ යෑම හේතුවෙන් ආනයන වියදම් පහළ යෑමත් සමඟ මෙම කාණ්ඩය යටතේ වන විශාලතම ආනයන සංරචකය වන ඉන්ධන සඳහා වන වියදම ද පහළ යෑමක් වාර්තා කළේය. මීට ප්‍රතිවිරුද්ධව, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පොහොර ආනයන වියදම සියයට 213.8කින් (එ.ජ. ඩොලර් මිලියන 115.8) සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**ආයෝජන භාණ්ඩ:** 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ද පහළ ගියේය. ප්‍රධාන ආයෝජන භාණ්ඩ උපකාණ්ඩ තුන යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම වර්ගවල භාණ්ඩ, එනම් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ පහළ යෑමක් වාර්තා කළේය.

**රූප සටහන 5: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: ආනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

[2] ආනයන සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය සිව්වන සංස්කරණය පදනම් කර ගත් ආනයන සංයුතිය, පිළිවෙළින්, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

## වෙළඳ දර්ශක

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 13.3කින් පහළ ගිය අතර, ආනයන මිල ගණන් ඉහළ යෑම සහ අපනයන මිල ගණන් පහළ යෑම මේ සඳහා හේතු විය. 2022 වසර සඳහා වන වෙළඳ මිල අනුපාතය 2021 වසරට සාපේක්ෂව දර්ශක අංක 87.8ක් දක්වා සියයට 9.9කින් පහළ ගියේය.

**රූප සටහන 7: වෙළඳ මිල අනුපාතය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ආදායම පහළ යෑම සඳහා අපනයන මිල ගණන් පහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සියයට 1.3කින් ඉහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 8.9කින් පහළ ගියේය. මේ අතර, අපනයන පරිමා දර්ශකය සහ අපනයන ඒකක මිල දර්ශකය, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 1.9කින් සහ සියයට 2.9කින් ඉහළ ගියේය.

**රූප සටහන 8: අපනයන පරිමා හා ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ආනයන වියදම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආනයන පරිමාව හේතු වූ බව නිරූපණය කරමින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා දර්ශකය සියයට 39.5කින් පහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 5.1කින් ඉහළ ගියේය. 2022 වසර තුළ දී, 2021 වසරට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 22.4කින් පහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 14.1කින් ඉහළ ගියේය.

**රූප සටහන 9: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශීය ජංගම ගිණුමේ වාර්තා වූ අනෙකුත් ප්‍රධාන වර්ධනයන්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** වසරේ අග භාගයේ දී කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ ද, 2022 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 3,789 ක් වූ අතර, එය 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 5,491ට සාපේක්ෂව සියයට 31.0ක අඩුවීමක් වාර්තා කළේය. 2022 වසරේ නොවැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 384ට සාපේක්ෂව 2022 වසරේ ඉහළම මාසික ප්‍රේෂණ ප්‍රමාණය වාර්තා කරමින්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 476ක් දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් නුපුහුණු (101,786), පුහුණු (88,215) සහ ගෘහ සේවිකා (73,781) යන කාණ්ඩවල දායකත්වයෙන්, 2022 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු පිටවීම් 299,934ක් ලෙස වාර්තා විය. 2022 වසරේ දෙසැම්බර් මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු පිටවීම් 23,407ක් ලෙස වාර්තා විය.

**සංචාරක පැමිණීම්:** 2019 වසරෙන් පසු වැඩිම සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා කරමින්, 2021 වසරේ සංචාරක පැමිණීම් 194,495ට සාපේක්ෂව, 2022 වසර තුල සංචාරක පැමිණීම් 719,978 ක් වාර්තා කළේය. 2022 වසරේ නොවැම්බර් මාසයේ වාර්තා වූ 59,759ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 91,961ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දෙසැම්බර් මාසය තුළ වැඩිම සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා වූ රටවල් ලෙස රුසියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සහ ජර්මනිය පැවතුණි. 2021 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 507ට සාපේක්ෂව, 2022 වසරේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,136ක්[3] ලෙස ඇස්තමේන්තු කර ඇත. 2022 වසරේ නොවැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 81ක්[3] සහ පෙර වසරේ දෙසැම්බර් මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 233ට සාපේක්ෂව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 127ක්[3] ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 11: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 12: සංචාරක ඉපැයීම්[3] සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

---

[3] 2022 වසරේ දී ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංශෝධනය කරන ලදී.

## මූලය ලැබීම්

2022 වසරේ දෙසැම්බර් මාසයේ තුළ දී සුළු ශුද්ධ ලැබීමක් වාර්තා කරමින්, 2022 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 51ක සමුච්චිත ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මේ අතර, සමුච්චිත පදනම මත, 2022 වසර තුළ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 182ක විදේශීය ආයෝජන ශුද්ධ ලැබීමක් වාර්තා විය. ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත කැපී පෙනෙන සුළු ශුද්ධ විදේශ ලැබීමක් ලැබීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2022 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.9ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.4කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. මහ බැංකුව 2022 වසරේ දෙසැම්බර් මස වෙළඳපළෙන් විදේශ විනිමය ශුද්ධ අවශෝෂණයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට ද්‍රවශීලි සංචිතවල සුළු වර්ධනයක් වාර්තා කළේය.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**2022 වසරේ මැයි මස මැද දී දෛනික විචලන පරාසය හඳුන්වා දීමෙන් පසුව විනිමය අනුපාතිකයේ සමස්තයක් ලෙස පැවති ස්ථාවරත්වය 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ද අඛණ්ඩව පැවතුණි.** 2022 වසරේ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.8ක වාර්ෂික අවප්‍රමාණයක් වාර්තා කළ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ඕස්ට්‍රේලියානු ඩොලරය, ඉන්දියානු රුපියල, ස්ටර්ලින් පවුම සහ ජපන් යෙන්වලට සාපේක්ෂව අවප්‍රමාණය විය. මේ අතර, 2023 වසරේ ජනවාරි මස 31වන දින දක්වා කාලය තුළ, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 0.3 ක අතිප්‍රමාණය වීමක් වාර්තා කර ඇත. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින්, 2023 වසරේ ජනවාරි මස 31වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, ඉන්දියානු රුපියල, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ජපන් යෙන්වලට සාපේක්ෂව අවප්‍රමාණය විය. මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) 2022 වසරේ මාර්තු-මැයි කාලය තුළ දී කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වූ අතර, ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය තරඟකාරීත්වයෙහි වර්ධනයක් පෙන්නුම් කරමින් දර්ශක අංක 100යේ සීමාවට වඩා බොහෝ දුරට පහළ මට්ටමක පැවතුණි.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**රූප සටහන 15: මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස්වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2021 | 2022 | 2023 (ජනවාරි 31 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -7.0% | -44.8% | +0.3% |
| යූරෝ | +1.1% | -41.4% | -1.6% |
| ස්ටර්ලින් පවුම | -6.0% | -38.1% | -2.3% |
| ජපන් යෙන් | +3.8% | -36.4% | -1.6% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -1.2% | -40.8% | -3.8% |
| ඉන්දියානු රුපියල | -5.5% | -38.6% | -1.2% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**2023 වසරේ ජනවාරි මාසය සඳහා වන විදේශීය අංශයේ පුවත්පත් නිවේදනය 2023 වසරේ පෙබරවාරි මස 28වන දින නිකුත් කරනු ඇත.**

**ඇමුණුම I :**

| කාණ්ඩය | 2021 දෙසැම්බර් එ.ජ.ඩො. මිලියන | 2022 දෙසැම්බර් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2021 එ.ජ.ඩො. මිලියන | 2022 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,156 | 1,068 | -7.7 | 12,499 | 13,106 | 4.9 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 2,241 | 1,426 | -36.4 | 20,637 | 18,291 | -11.4 |
| වෙළඳ ශේෂය | -1,085 | -358 | | -8,139 | -5,185 | |
| සංචාරක ඉපැයීම් | 233 (ආ) | 127 (ඇ) | -45.4 | 507 (ආ) | 1,136 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 325 | 476 | 46.3 | 5,491 | 3,789 | -35.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 4 | 37 | | -238 | 182 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 91 | 208 | | 2,435 | 2,259 (ඉ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 1 | 7 | | 17 | 69 | |
| දිගුකාලීන ණය | 348 | ලැ.නො. | | 1,608 | 2,190 (ඉ) | |
| ඒකාබද්ධ ණය පහසුකම | - | - | | 810 | - | |
| සමස්ත ශේෂය | | | | -3,967 | -2,773 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

(ඇ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ

(ඉ) දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2022 නොවැම්බර් මාසය දක්වා පමණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

ඇමුණුම II:

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2021 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **916.8** | **840.9** | **-8.3** | **9,702.1** | **10,465.3** | **7.9** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 57.4 | 36.7 | -36.0 | 586.9 | 519.5 | -11.5 |
| සත්ත්ව ආහාර | 12.3 | 19.0 | 54.0 | 149.4 | 170.5 | 14.1 |
| රෙදිපිළි හා ඇඟලුම් | 533.2 | 481.5 | -9.7 | 5,435.1 | 5,952.0 | 9.5 |
| එයින්, ඇඟලුම් | 484.8 | 442.6 | -8.7 | 4,951.5 | 5,483.1 | 10.7 |
| රෙදිපිළි | 38.9 | 29.8 | -23.3 | 355.4 | 353.7 | -0.5 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 9.5 | 9.1 | -4.0 | 128.1 | 115.2 | -10.1 |
| රබර් නිෂ්පාදිත | 90.3 | 71.2 | -21.1 | 1,050.4 | 977.0 | -7.0 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.4 | 35.3 | 51.1 | 276.8 | 450.6 | 62.8 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 43.2 | 50.5 | 16.9 | 500.9 | 580.9 | 16.0 |
| ප්‍රවාහන උපකරණ | 9.6 | 6.5 | -32.4 | 148.2 | 129.3 | -12.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 51.0 | 49.4 | -3.1 | 506.4 | 568.0 | 12.2 |
| රසායනික නිෂ්පාදිත | 21.7 | 16.1 | -25.6 | 223.2 | 223.5 | 0.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 12.0 | 9.9 | -17.6 | 129.9 | 136.9 | 5.4 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.5 | 9.8 | 286.5 | 50.0 | 53.1 | 6.1 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.4 | 7.4 | 16.5 | 58.4 | 85.8 | 46.9 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.3 | 3.9 | -37.9 | 78.6 | 60.9 | -22.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 15.1 | 12.6 | -16.1 | 156.4 | 176.7 | 13.0 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 3.0 | 2.7 | -8.9 | 37.4 | 38.1 | 1.8 |
| වෙනත් කාර්මික අපනයන | 29.5 | 28.2 | -4.6 | 314.1 | 342.4 | 9.0 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **232.3** | **203.4** | **-12.4** | **2,729.5** | **2,568.0** | **-5.9** |
| තේ | 110.6 | 107.3 | -3.0 | 1,324.4 | 1,258.8 | -5.0 |
| රබර් | 3.2 | 3.2 | 0.2 | 42.2 | 41.4 | -1.8 |
| පොල් | 31.4 | 24.8 | -21.0 | 425.2 | 400.3 | -5.9 |
| කුළුබඩු | 43.7 | 31.3 | -28.2 | 454.8 | 368.7 | -18.9 |
| එළවළු | 2.3 | 2.2 | -4.9 | 28.5 | 26.7 | -6.6 |
| සකස් නොකළ දුම්කොළ | 2.1 | 2.4 | 14.9 | 31.6 | 24.4 | -22.8 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 12.4 | 10.9 | -12.1 | 148.8 | 178.8 | 20.2 |
| මුහුදු ආහාර | 26.7 | 21.3 | -20.0 | 274.1 | 269.0 | -1.8 |
| **3. ඛනිජ අපනයන** | **5.1** | **20.9** | **314.6** | **44.5** | **50.0** | **12.3** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.1** | **2.4** | **12.1** | **22.5** | **23.2** | **3.2** |
| **මුළු අපනයන** | **1,156.3** | **1,067.6** | **-7.7** | **12,498.6** | **13,106.4** | **4.9** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම III:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2021 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **246.0** | **224.0** | **-8.9** | **2,846.0** | **2,701.8** | **-5.1** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 31.2 | 24.0 | -23.1 | 316.0 | 301.2 | -4.7 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 6.2 | 6.5 | 4.2 | 71.8 | 77.5 | 7.9 |
| 05 එළවළු හා පලතුරු | 38.4 | 30.2 | -21.5 | 468.2 | 449.0 | -4.1 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 150.3 | 139.1 | -7.5 | 1,742.9 | 1,611.1 | -7.6 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **17.6** | **11.1** | **-37.1** | **145.2** | **135.8** | **-6.5** |
| 11 පාන වර්ග | 3.4 | 2.7 | -20.1 | 33.3 | 46.7 | 40.2 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 14.2 | 8.4 | -41.1 | 112.0 | 89.2 | -20.4 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **36.1** | **46.8** | **29.8** | **433.2** | **450.3** | **3.9** |
| 23 සකස් නොකළ රබර් | 3.3 | 3.3 | -1.0 | 43.1 | 42.4 | -1.5 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 17.4 | 13.4 | -23.1 | 240.3 | 228.6 | -4.9 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **51.0** | **49.4** | **-3.1** | **506.4** | **568.0** | **12.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 51.0 | 41.3 | -18.9 | 462.9 | 544.1 | 17.5 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | 8.1 | - | 43.5 | 23.9 | -44.9 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **11.7** | **4.8** | **-58.6** | **128.9** | **89.9** | **-30.3** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 6.9 | 4.8 | -30.4 | 86.1 | 75.4 | -12.4 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **29.7** | **18.4** | **-38.0** | **291.7** | **271.5** | **-6.9** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **155.0** | **144.5** | **-6.8** | **1,700.7** | **1,876.0** | **10.3** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 60.6 | 49.7 | -18.0 | 684.5 | 680.3 | -0.6 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 44.8 | 36.7 | -18.1 | 458.4 | 447.1 | -2.5 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 29.3 | 40.1 | 36.6 | 335.1 | 510.5 | 52.3 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **51.6** | **55.5** | **7.6** | **631.8** | **692.1** | **9.5** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 27.6 | 30.9 | 12.1 | 318.4 | 364.2 | 14.4 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **557.4** | **513.0** | **-8.0** | **5,813.1** | **6,320.3** | **8.7** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 519.1 | 469.4 | -9.6 | 5,360.0 | 5,832.0 | 8.8 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.2** | **-** | **-** | **1.5** | **0.8** | **-47.7** |
| **මුළු අපනයන** | **1,156.3** | **1,067.6** | **-7.7** | **12,498.6** | **13,106.4** | **4.9** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම IV:

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2021 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **419.3** | **241.5** | **-42.4** | **3,848.7** | **2,813.0** | **-26.9** |
| ආහාර හා පාන වර්ග | 171.2 | 129.9 | -24.1 | 1,666.5 | 1,607.9 | -3.5 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 50.9 | 26.5 | -47.9 | 97.4 | 430.5 | 342.3 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 14.1 | 20.5 | 45.6 | 317.7 | 225.3 | -29.1 |
| එළවළු (ආ) | 33.2 | 21.3 | -36.0 | 384.3 | 318.4 | -17.1 |
| මුහුදු ආහාර | 10.2 | 3.6 | -65.2 | 122.3 | 66.4 | -45.7 |
| සීනි හා රසකැවිලි | 33.4 | 34.3 | 2.7 | 288.8 | 257.8 | -10.7 |
| කුළුබඩු | 7.0 | 12.1 | 71.9 | 127.2 | 136.6 | 7.4 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.4 | 11.7 | -47.8 | 328.8 | 172.8 | -47.4 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 248.1 | 111.6 | -55.0 | 2,182.2 | 1,205.1 | -44.8 |
| පෞද්ගලික රථවාහන | 0.6 | 3.5 | 512.1 | 12.8 | 11.7 | -8.5 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 128.5 | 57.8 | -55.0 | 882.5 | 533.4 | -39.6 |
| ගෘහ උපකරණ | 21.5 | 3.9 | -81.7 | 257.1 | 85.5 | -66.7 |
| රෙදිපිළි හා උපාංග | 23.4 | 14.8 | -36.7 | 221.3 | 215.6 | -2.6 |
| විදුලි සංදේශ උපකරණ | 31.0 | 5.3 | -82.9 | 382.9 | 69.0 | -82.0 |
| ගෘහ හා දැව භාණ්ඩ | 16.7 | 10.8 | -35.1 | 161.2 | 116.3 | -27.9 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 26.5 | 15.4 | -41.7 | 264.4 | 173.7 | -34.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,368.3** | **983.8** | **-28.1** | **12,308.9** | **12,438.8** | **1.1** |
| ඉන්ධන | 442.5 | 383.5 | -13.3 | 3,742.9 | 4,896.8 | 30.8 |
| එයින්, බොරතෙල් | 59.7 | 67.9 | 13.7 | 625.1 | 483.8 | -22.6 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 339.9 | 300.5 | -11.6 | 2,840.0 | 4,048.2 | 42.5 |
| ගල්අඟුරු | 42.9 | 15.1 | -64.7 | 277.8 | 364.8 | 31.3 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 13.8 | 16.6 | 20.3 | 143.6 | 203.8 | 41.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 297.9 | 200.9 | -32.6 | 3,066.9 | 3,065.2 | -0.1 |
| කඩදාසි හා ඝන කඩදාසි | 37.6 | 33.9 | -9.9 | 468.9 | 465.9 | -0.6 |
| කෘෂිකාර්මික යෙදවුම් | 22.8 | 18.6 | -18.6 | 264.2 | 214.5 | -18.8 |
| තිරිඟු හා ඉරිඟු | 30.2 | 35.8 | 18.5 | 418.3 | 303.1 | -27.5 |
| මූල ලෝහ | 187.5 | 13.5 | -92.8 | 866.4 | 323.2 | -62.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 77.6 | 41.8 | -46.2 | 765.7 | 650.8 | -15.0 |
| රසායනික නිෂ්පාදිත | 99.9 | 65.1 | -34.8 | 1,074.4 | 966.2 | -10.1 |
| පොහොර | 36.9 | 115.8 | 213.8 | 158.2 | 275.9 | 74.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 39.2 | 12.1 | -69.0 | 400.7 | 334.7 | -16.5 |
| ඛනිජ නිෂ්පාදිත | 13.8 | 4.9 | -64.7 | 158.9 | 123.7 | -22.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 68.4 | 41.3 | -39.6 | 779.7 | 615.0 | -21.1 |
| **3. ආයෝජන භාණ්ඩ** | **452.9** | **200.0** | **-55.8** | **4,462.7** | **3,030.5** | **-32.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 307.7 | 130.0 | -57.8 | 2,809.5 | 1,969.0 | -29.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 124.1 | 62.4 | -49.7 | 1,248.9 | 926.3 | -25.8 |
| ප්‍රවාහන උපකරණ | 20.8 | 7.6 | -63.6 | 398.5 | 132.1 | -66.8 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.1 | -75.0 | 5.8 | 3.0 | -47.9 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **0.3** | **-49.5** | **17.1** | **8.8** | **-48.8** |
| **මුළු ආනයන** | **2,241.0** | **1,425.6** | **-36.4** | **20,637.4** | **18,291.0** | **-11.4** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,798.5** | **1,042.0** | **-42.1** | **16,894.6** | **13,394.2** | **-20.7** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම V:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2021 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 දෙසැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **230.2** | **188.5** | **-18.1** | **2,275.2** | **2,162.2** | **-5.0** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුළු බිත්තර | 14.1 | 20.6 | 45.8 | 318.1 | 225.7 | -29.1 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 10.4 | 3.7 | -64.5 | 123.6 | 67.7 | -45.2 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 80.7 | 61.9 | -23.4 | 513.0 | 729.0 | 42.1 |
| 05 එළවළු හා පලතුරු | 42.0 | 25.3 | -39.9 | 457.7 | 365.4 | -20.2 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 33.4 | 34.3 | 2.7 | 288.9 | 257.8 | -10.7 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.1 | 16.1 | 33.1 | 169.5 | 180.0 | 6.2 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **7.8** | **7.8** | **...** | **76.8** | **101.0** | **31.5** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **56.3** | **23.1** | **-59.0** | **584.7** | **465.3** | **-20.4** |
| 23 සකස් නොකළ රබර් | 34.0 | 8.7 | -74.4 | 351.0 | 283.6 | -19.2 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 2.7 | 1.7 | -37.2 | 25.0 | 30.5 | 22.2 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **442.5** | **383.5** | **-13.3** | **3,742.9** | **4,896.8** | **30.8** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 378.5 | 338.8 | -10.5 | 3,118.4 | 4,288.0 | 37.5 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 21.1 | 29.6 | 40.3 | 346.6 | 243.9 | -29.6 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **8.8** | **2.4** | **-72.8** | **285.2** | **79.8** | **-72.0** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 7.2 | 1.7 | -76.6 | 262.3 | 65.6 | -75.0 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **345.2** | **279.1** | **-19.2** | **2,847.9** | **2,392.2** | **-16.0** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 124.7 | 54.5 | -56.3 | 823.1 | 502.3 | -39.0 |
| 56 පොහොර | 36.9 | 115.8 | 213.8 | 157.6 | 275.8 | 74.9 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 58.7 | 26.0 | -55.8 | 561.2 | 438.6 | -21.8 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 18.1 | 15.0 | -17.1 | 173.3 | 174.7 | 0.8 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **675.8** | **330.9** | **-51.0** | **5,976.8** | **5,114.1** | **-14.4** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 34.9 | 32.2 | -7.6 | 442.0 | 436.7 | -1.2 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 292.1 | 194.8 | -33.3 | 3,007.8 | 2,991.0 | -0.6 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 49.7 | 34.0 | -31.6 | 525.2 | 485.0 | -7.7 |
| 67 යකඩ හා වානේ | 212.4 | 18.9 | -91.1 | 1,071.4 | 456.3 | -57.4 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **385.2** | **146.2** | **-62.0** | **3,876.2** | **2,278.1** | **-41.2** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 57.9 | 22.7 | -60.9 | 652.0 | 396.5 | -39.2 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 52.9 | 28.1 | -46.9 | 599.2 | 430.9 | -28.1 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 44.3 | 10.9 | -75.4 | 354.6 | 161.7 | -54.4 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 71.2 | 16.2 | -77.3 | 785.3 | 231.6 | -70.5 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 82.4 | 40.4 | -50.9 | 750.2 | 633.1 | -15.6 |
| 78 රථවාහන | 21.4 | 12.3 | -42.8 | 327.8 | 158.2 | -51.7 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **88.6** | **63.8** | **-27.9** | **953.3** | **791.3** | **-17.0** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 19.4 | 13.3 | -31.7 | 190.0 | 191.5 | 0.8 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 17.8 | 12.5 | -29.7 | 237.7 | 143.2 | -39.7 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.7** | **0.2** | **-70.7** | **18.4** | **10.3** | **-44.3** |
| **මුළු ආනයන** | **2,241.0** | **1,425.6** | **-36.4** | **20,637.4** | **18,291.0** | **-11.4** |

(අ) තාවකාලික

... සැලකිය යුතු නොවේ

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf